# අල්ලාහ්

ﷲ

අල්ලාහ්ගේ අනෙක් නම් සහ ගුණාංගවල සියලු අර්ථයන් ඇතුළත් වන නාමය මෙය වන අතර ඒවා සියල්ල පිළිඹිබු කරන්නේද මෙම නාමයයි. ඔහු හැර වෙන කිසිවෙක් නමස්කාර කිරීමට සුදුසු නැත.

## අල් ළාහිර්
## මතුපිට සිටින්නා

الظاهر

සියල්ලටම වඩා උසස් හා ඉහළින් සිටින තැනැත්තා ය. ඔහුට වඩා උසස් කිසිවක් නැත. සියල්ලෙහි ආධිපත්‍යය දරන තැනැත්තා ඔහුය .

مركز أصول

# අල් ආඛිර්
# අවසානයා

ඔහු සදාකාලික වන අතර විශ්වයේ ඇති සියල්ල විනාශ වී අවසානයේදී ඔහු වෙතට ම පැමිණෙනු ඇත. ඔහුගේ පැවැත්මට අවසානයක් නැත. ඔහු උසස් ය .

مركز أصول

# අල් (ක)හල්ලාක්
# උත්කෘෂ්ට මැවුම්කරු

## الخلاّق

"උත්කෘෂ්ට මැවුම්කරු" යනු සර්වබලධාරී අල්ලාහ් බහුල ලෙස නිර්මාණය කරන්නෙකු වේ යන අදහස දැක්වෙන නාමයකි.

උතුම් වූ ඔහු ම මෙම ශ්‍රේෂ්ට ගුණාංගයට හිමිකම් ඇත්තාය.

## අල් බාරිඃ

ආරම්භකයා

الباري

තමන් අභිමත කළ මැවීම්, ඒවා කිසිවක් ව නොතිබිය අවස්ථාවේ සිට ප්‍රථම වරට ප්‍රත්‍යක්ෂයට ගෙන ආ ආරම්භකයා ඔහුය.

مركز أصول

## අල් මුසව්විර්

හැඩගන්වන්නා

المصور

සිය ප්‍රඥාව, දැනුම, දයාව සහ
අභිමතයට අනුව තම නිර්මාණ සඳහා
විශේෂ රූප ලබා දුන්නේ ඔහුය.

අල් අව්වල්

ප්‍රථමයා

الأول

කිසිවක් හෝ කිසිවෙක් බිහි වීමට පෙර සිටම ඔහු ජීවමානය. සියලු මැවිලි බිහි වූයේ ඔහුගේ මැවීමෙනි. ඔහුගේ පැවැත්මට ආරම්භයක් නොමැත.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් කාදිර්
## අල් කදීර් - අල්මුක්තදිර්

**දක්ෂ - විශිෂ්ට හැකියාවන් ඇත්තා**

**බල අධිකාරී**

## القادر - القدير - المقتدر

පොළොවෙහි හෝ අහසෙහි ඇති කිසිවක් ඔහුගේ බලයෙන් හෝ කැමැත්තෙන් ගැලවෙන්නේ නැත. ඔහු ම සියල්ල තීරණය කරයි.

مركز أصول

# අල් (කා)හාලික්

## නිර්මාතෘ

الخالق

පෙර නොවූ  අයුරින් සියලු මැවිල්ල මැවූ
මැවුම්කරු ඔහුය.

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අල් මුඃමින්

විශ්වාසය දෙන තැනැත්තා

( ආරක්ෂාව සපයන්නා)

المؤمن

තමා විසින් එවන ලද ධර්ම දූතයින්ට සහ ඔවුන්ගේ අනුගාමිකයින්ට දේව විශ්වාසය ඇති කර ඔවුන්ගේ සත්‍යභාවයට සහය දැක්වීම සඳහා සිය සංඥාවන් හා සාධක මගින් ඔවුන්ව ශක්තිමත් කරන්නේ ඔහුය.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අල් කබීර්

අති මහත්ය

الْكَبِيرُ

ඔහු තමාගේම ගුණාංග හා ක්‍රියාවන්හි ශ්‍රේෂ්ඨ තැනැත්තාය. ඔහුට වඩා උතුම් කිසිවක් නැත. ඔහුගේ මහිමයට යාබදව සියල්ල කුඩා ය.

مركز أصول

## අර් රබ්
## පරමාධිපති

# الرَّبُّ

ඔහු තම වරප්‍රසාද තුළින් තම දාසයින් පෝෂණය කර ඔවුන් ව ක්‍රමයෙන් වර්ධකය කරන්නාය. තවද ඔහු සිය දැහැමි දාසයින්ගේ සිත් ප්‍රතිසංස්කරණය කර ඔවුන් උසස් කරවයි. ඔහු මැවුම්කරු, හිමිකරු සහ ස්වාමියාය.

# අල් අළීම්

## විශිෂ්ට

العَظِيم

ඔහු මහිමාන්විතය. විශිෂ්ට නම් සහ ගුණාංග ඔහු සතුය. එමනිසා, ඔහු ව මහිමයට පත් කිරීම හා උසස් කිරීම සහ ඔහුගේ ආඥා සහ තහනම් නියෝග වලට අවනත වීම ඔහුගේ දාසයින් හට පැවරෙන වගකීමකි.

# අල් අසීස්

සර්වබලධාරී

العزيز

ඔහු සර්වබලධාරියා ය. නින්දාඅපහාසයෙන් තොර වූ උතුම් හා උසස් තැනැත්තා ඔහුය. ඔහුට කීකරු වන තරමට දාසයෙකු ගෞරවය හා උසස් තත්වය භුක්ති විඳියි.



مركز أصول
ALLAH KNOWING knowingallah.com
GUIDE TO ISLAM

# අල් මුහයිමින්

සර්ව පාලකයා

المهيمن

සියලු දෑ නඩත්තු කරන්නේ ද ආරක්ෂා කරන්නේ ද ඒවා සෝදිසි කර බලන්නේ ද ඔහුය.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අල් වදූද්

## ආදරවන්ත

الودود

තම ගැත්තන් අතුරින් ඔහුට අවනත වන එමෙන්ම ඔහු වෙත යොමු වන ගැත්තන් කෙරෙහි ඔහු ප්‍රිය කරන්නේය. ඔවුන්ව ප්‍රශංසාවට ලක් කරන්නේය. ඔවුන් වෙත පමණක් නොව සෙසු අයට ද ඔහු උපකාර කරන්නේය. තම දයාවෙන් ඔහුගේ මැවීම් වලට සෙනෙහස පාන්නේය.

# අස් සලාම්

සාමයේ උල්පත
(සහ පරිපූර්ණ)

السلام

සිය ගුණාංග, නම් සහ ක්‍රියාවන් වල
අඩුපාඩු හා දෝෂ වලින් තොර වූ
තැනැත්තා ඔහුය. මෙලොවට හා
පරලොවට අයත් සෑම සාමයක්ම ඔහුගෙන්
ම පැමිණේ.

مركز أصول

# අල් කුද්දූස්

## ශුද්ධෝත්තම

القدوس

කිසිදු අඩුපාඩුවක් හෝ දෝෂයක් තමන් සතු නැති ශුද්ධෝත්තමයාණන් ඔහුය. මක්නිසාදත් පරිපූර්ණත්වයේ ගුණාංග ඔහු සතුව පවතී.

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අල් හකීම්

## ප්‍රඥාවන්ත

الحكيم

සෑම දෙයක්ම නිසි අයුරින් සිදු කරන්නේ ඔහුය. ඔහුගේ සැලසුම් කිසි විටෙකත් කිසිදු අඩුපාඩුවක් හෝ දෝෂයකින් විනාශ නොවේ. ඔහුගේ නිර්මාණයන් හරහා හා ඔහු සිදු කරන දෙයින් ඔහුගේ ප්‍රඥාව පිළිඹිබු වේ. ඔහුගේ විනිශ්චයන් නිරවද්‍ය ඒවා ය.

# අල් මලික්:
## හිමිකරු

الملك

අහසෙහි මෙන්ම පොළොවෙහි
සහ ඒවා අතර ඇති සියල්ලෙහි
ආධිපත්‍යය හිමි වන්නේ ඔහුටය.
තවද සිය අභිමතය හා ප්‍රඥාව
අනුව විශ්වයේ කටයුතු
හසුරවන්නේ ද ඔහුමය.

مركز أصول
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
ALLAH KNOWING knowingallah.com
GUIDE TO ISLAM

# අල් ජබ්බාර්

## මැඩ පවත්වා පාලනය කරන්නා

ජීවීන් කෙරෙහි තම කැමැත්ත ක්‍රියාත්මක කරන මහිමාන්විත තැනැත්තා ඔහුය. ධනයෙන් දුප්පතුන්ට උපකාර කරන, සුව කිරීමෙන් රෝගීන් ආරක්ෂා කරන, දුක් විඳින අය කෙරෙහි සහන සලසන තැනැත්තා ද ඔහුය.

# අල් මුතකබ්බිර්

මහෝදාර

المتكبر

ඔහු මහෝදාර හා උසස් ය. ඔහු නොහැකියාව පරාජය වැනි සෑම දුර්වලතාවයක්ම අභිබවා ගරු ගාම්භීරයෙන් පසුවන්නෙකි.


مركز أصول
අල් ජව්වාද්
නිර්ලෝභී
الجواد
ඔහු තම දාසයන්හට බොහෝ වරප්‍රසාද හා ආශීර්වාද ලබා දෙන්නාය.
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

# අල් අක්‍රම්

## මහා ත්‍යාගශීලී

الأكرم

සෑම ත්‍යාගශීලී කෙනෙකුට වඩා අල්ලාහ් ත්‍යාගශීලීභාවයෙන් උසස් බව මෙයින් අදහස් කෙරේ. ඔහුට මේ විෂයෙහි කිසිවකු සමාන වන්නේ නැත. සැබවින්ම සියලු යහපත් දේ අල්ලාහ් සතුව ඇති අතර සියලු යහපතක් ම පැමිණෙන්නේ ඔහු වෙතිනි .

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

# අල් වහ්හාබ්
පිරිනමන්නා

الوهاب

කරුණාව හා දයාව
හේතුවෙන් තම දාසයන් හට
බොහෝ වරප්‍රසාද ලබා
දෙන්නේ ඔහු ය.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

# අල් - ඝනී

## අවශ්‍යතාවන්ගෙන් තොර ය

الْغَنِيُّ

ඔහු මැවීම්හි අවශ්‍යතාවන්ගෙන් තොර ය. ඔහු පොහොසත් ය. මක්නිසාදයත් ඔහු පරිපූර්ණ ගුණාංග වලින් යුක්තය. මැවීම් සියල්ල ඔහු මත යැපෙන්නෝ වෙති.

# අල් කරීම්

## ත්‍යාගශීලී

الكريم

ත්‍යාගශීලිත්වය යනු අල්ලාහ්ගේ අනුග්‍රහය සහ ඔහුගේ පිරිනැමීමේ ශ්‍රේෂ්ඨත්වය අදහස් කරන නමකි. නියත වශයෙන්ම අල්ලාහ් ත්‍යාගශීලී වන අතර ඔහු ත්‍යාගශීලීභාවයට ප්‍රිය කරයි.

## අර් රහීම්:

අසම සම කරුණාන්විත

الرَّحِيمُ

ඔහු මැවීම කෙරෙහි ඉමහත් දයාව කරුණාව ඇති තැනැත්තා ය. මෙම කරුණාවට ඇතුළත් වන්නේ දේව විශ්වාසවන්තයින්, යහපත් ක්‍රියා කරන්නන් සහ දයානුකම්පිත පුද්ගලයින් ය.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අර් රඌෆ්

සර්ව කරුණාන්විත

الرؤوف

සර්ව - කරුණාන්විත

එය සම්පූර්ණ කරුණාව පිළිඹිබු කරයි.
කරුණාව යනු දයාවේ ඉහළම මට්ටමයි.
මිනිසුන්ට කරුණාව දක්වන තැනැත්තා
හට සර්වබලධාරී අල්ලාහ් විසින්
කරුණාව දක්වනු ලැබේ.

مركز أصول

## අල් - මුකද්දිම්
## අල් - මුඅඛ්ඛිර්

පෙරටු කරන්නා

ප්‍රමාද කරන්නා

# المقدم - المؤخر

ඔහු අභිමත කරන දෑ පෙරටු කරන්නේ ය. ඔහු අභිමත දෑ ප්‍රමාද කරන්නේ ය. ඔහු අභිමත දෑ උසස් කරවන්නේ ය. ඔහු අභිමත කළ දෑ පහත් කරන්නේ ය. ඔහු අභිමත අය ට ගෞරවය පිරිනමන්නේ ය. ඔහු අභිමත කරන අය ව අවමානයට ලක් කරන්නේ ය.

## අල් මුසඃඉර්

### මිල නියම කරන්නා

المُسَعِّرُ

සියලු වස්තූන්හි වටිනාකම, තරාතිරම හෝ බලපෑම වැඩි කරන්නේ හෝ අඩු කරන්නේ ඔහුය. එබැවින් උන්වහන්සේගේ ප්‍රඥාව, දැනුම සහ දයාව අනුව ඒවායේ මිල ඉහළ යයි.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

مركز أصول

## අල් - මන්නාන් :

## මහා පරිත්‍යාගශීලී

# الْمَنَّانُ

ඔහු යමක් අසන්න ට පෙර අධික සම්පත් ලබා දෙන්න ට ආරම්භ කරන්නා ය. විවිධාකාර උපකාරයන් භාග්‍යයන් පෝෂණයන් දීමනාවන් කාලයා සමඟ ම මැවීම් වලට ලබා දෙන්නා ය.

# අර් රහ්මාන්
## පරම දයාබර

الرحمن

**පරම දයාබර:**

මෙම නමින් අල්ලාහ්ගේ අතිමහත් දයාව නිරූපණය වේ. සර්වබලධාරී අල්ලාහ්ට පමණක් ආවේණික මෙම නම හා අනෙකුත් නම් අප කිසිවකුටත් නමක් වශයෙන් තබාගත නොහැක.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අද් - දෙයියාන් :
## පිරිනමන්නා

# الدَّيَّانُ

ඔහු ගැත්තන්ගෙන් ඔවුන් කළ දෑ ගැන විභාග කරන්නේ ය. ඔවුන ට ඒ සඳහා ප්‍රතිඵල පිරිනමන්නේ ය. නැවත යොමු කරනු ලබන දිනයේ ඔවුන් අතර තීන්දු ලබා දෙන්නේ ය.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

## අල් මුඃතී
## ලබාදෙන්නා

# المعطي

ඔහු තම වස්තු වලින් තමන්ට අවශ්‍ය ඕනෑම දෙයක් තම ගැත්තන් හට ලබා දෙයි. ඔහුගේ මෙම ලබා දීමේ ක්‍රියාවලිය කිසිවෙකුට අවහිර කළ නොහැක. දැහැමි ගැත්තන් හට ඔහුගේ ත්‍යාගයෙන් වැඩි පංගුවක් හිමි වේ. සෑම ජීවියෙකුටම ඔවුනට ආවේනික වූ හැඩයක් ලබා දුන්නේ ඔහුය.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

مركز أصول

# අල් - හාදී
## මඟ පෙන්වන්නා

الهادي

දැහැමි පැවැත්මක් සඳහා ඔහු ඔහුගේ මැවීම් වලට මඟ පෙන්වන්නා ය. සියලුම යහ කටයුතු සඳහා තම ගැත්තන් ට මඟ පෙන්වන්නා ය. අසත්‍ය මාර්ගයෙන් සත්‍ය මාර්ගය පැහැදිලි කරන්නා ය.

مركز أصول

## අල් කාබිළ් -අල් බාසිත්

මිට මොළවා ගන්නා

විහිදුවාලන්නා

## القابض-الباسط

ඔහු ගේ පරිපූරණ දැනුමෙන් හා ඔහුගේ තීන්දුවෙන් ඔහු අභිමත කරන අය ට ඔහු ගේ උපකාරය හා ඔහුගේ යහපත සීමා කරන්නේ ය. ඔහු තම භාගයය විහිදුවාලන්නේ ය. ඔහු ගේ පෝෂණය ඔහු අභිමත කරන ගැත්තන් හට විස්තීරණ ය කරන්නේ ය.

ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

مركز أصول

# තයියිබ්
# පිවිතුරු ය

## الطَّيِّبُ

ඔහු කිසියම් අඩුපාඩුවකින් හෝ ඌනතාවකින් තොර වූ නිර්මල ය. එමෙන් ම නිරපේක්ෂ සුන්දරත්වය හා පරිපූර්ණත්වය ඇති තැනැත්තා ය. තම දාසයින් හට බොහෝ යහපත් දෑ ද පිරිනමයි. ඔහු පිළිගන්නේ පිවිතුරු දෑ සහ ඔහු වෙනුවෙන් අවංකව කරන ක්‍රියාවන් සහ පුණ්‍ය කටයුතු පමණි.

مركز أصول

# රෆීක්
# මෛත්‍රී ය

# الرَّفِيقُ

එකවරම සියල්ල සිදු කිරීමට ඔහුට හැකි වුවද ඔහු නිර්මාණය කිරීම සහ නීති සම්පාදනය කිරීමේදී ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරන්නාය. සියලු ගැත්තන් සමඟ මෛත්‍රීව කටයුතු කරන්නේ ය. ඔවුන ට කරුණා කරන්නේ ය. ඔවුන් සමඟ මෘදු ව ක්‍රියා කරන්නේ ය.

مركز أصول

# අල් මුකීත්
# රක්ෂක ය

المقيت

සියලු දෑ ආරක්ෂා කරන්නා ඔහු ය. සියලු දෑ ක්‍රියාත්මක කරන්නා ද ඔහු ය. එමෙන් ම සියලු මැවීම් වලට ආහාර සපයන්නා ද ඔහු ය.

## අල් කාෆී
## ප්‍රමාණවත් වන්නා

# الكَافِي

තම ගැත්තන්හට ඇති වන තාඩන පීඩන හා නොයෙකුත් බාධා කම්කටුලු ඉවතලීමට ප්‍රමාණවත් වන්නේ ඔහු පමණි.

مركز أصول

## අර් - ර$^{z}$ස්$^{z}$සාක්

### සර්ව පෝෂකයා

الرزاق

මැවීම් සියල්ලට ම ඔහු ඔහුගේ පෝෂණ ක්‍රියාවලිය ව්‍යාප්ත කර දී ඇත. සෑම කෙනෙකු ම ආහාර අනුභව කරනුයේ ඔහු දෙන පෝෂණයෙනි. සෑම කෙනෙකු ම ජීවත් වනුයේ ඔහුගේ පාලනය යටතේ ය.

අෂ් ෂාෆී-
අත් තබීබ්
සුවකරන්නා - ප්‍රතිකාර කරන්නා

# الشَّافِي - الطَّبِيبُ

සෑම අනතුරකට ම සෑම ශාරීරික හෝ මානසික ආබාධයකට ම හා සෑම ලෙඩකට ම සුවය ලබා දෙන්නා ඔහු ය. එහි කිසිදු හවුල්කරුවෙකු නොමැත.  සෑම ලෙඩකට ම ප්‍රතිකාරය හා සුවය මැව්වේ ද ඔහු ය.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
ALLAH KNOWING knowingallah.com
GUIDE TO ISLAM

## අල් හසීබ්

ප්‍රමාණවත් වන්නා

ගණනය කරන්නා

الحَسِيبُ

ලෞකික හා ආගමික කටයුතුවලදී තම ගැත්තන්ගේ සියලු කරදර සඳහා ප්‍රමාණවත් වන්නේ ඔහුය. සැබෑ විශ්වාසවන්තයින් ඔහුගේ ප්‍රමාණවත්භාවයෙන් වැඩි ප්‍රමාණයක් දිනා  ගනු ඇත. ගැත්තන්ගේ ක්‍රියාවන් ගණනය කර ඒ සඳහා  කුලිය ලබා දෙන්නේ ද ඔහු ය.

# අස් සුබ්බූහ්
# අති පාරිශුද්ධ ය

## السُّبُّوحُ

සියලු අඩු පාඩුවලින් පිවිතුරු ය. අහස් හත හා මහ පොළොව ද ඒ තුළ ඇති දෑ ද ඔහු ව සුවිශුද්ධ කරති. එමෙන් ම ඔහු ට ඇති අලංකාර නාමයන් හා ඔහුගේ උසස් ගුණාංගයන් හේතුවෙන් සියලු දෑ ඔහු ට ප්‍රශංසා කරමින් ඔහු ව සුවිශුද්ධ කරන්නේ ය.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

අර් රකීබ්

මුරකරු

الرَّقِيبُ

මැවීම් නිරීක්ෂණය කර ඔවුන්ගේ ක්‍රියාවන් ඇතුළු සියල්ල සටහන් කරන්නේ ඔහු ය. ඔහුට කිසිවක් අතපසු නොවේ.



ALLAH KNOWING knowingallah.com

GUIDE TO ISLAM

مركز أصول

# අල් මුහ්සින්

උපකාරශීලී

المحسن

ඔහු, මැවූ සියල්ල ප්‍රගුණ කළ අයෙකු වේ. තවද ඔහු ඔහුගේ කරුණාවෙන් හා මහත් ආශිර්වාදවලින් තම දාසයින්හට යහපත දායාද කරනු ඇත.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

# අල් බර්
## ප්‍රතිලාභ ලබා දෙන්නා

البر

මැවීම් සඳහා ප්‍රතිලාභ පිරිනමන තැනැත්තා ඔහුය. ඔහුගේ ආශීර්වාද ගණන් කිරීමට කිසිවෙකුටත් නොහැකිය. ලබා දුන් පොරොන්දු සැමවිටම පිළිපදින්නේ ඔහුය.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

# අල් හක්
# සත්‍ය ය

الحق

ජීවමානයෙන් හා පැවැත්මෙන් උසස් හා තම ගුණාංගවල පරිපූර්ණ තැනැත්තාද ඔහුය. එබැවින් ඔහු හැර වෙන කිසිවෙකු නමස්කාර කිරීමට සුදුසු නැත. ඔහු හැර නැමදුමට ලක් වන සෑම දෙයක්ම අසත්‍ය ඒවා ය. ඔහුගේ කථාව සත්‍යය. ඔහුගේ ක්‍රියා සත්‍යය. ඔහුගේ පොරොන්දුව සත්‍යය.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

مركز أصول

# අල් වකීල්
# අල් කෆීල්

භාරකරු

ආරක්ෂක

## الوكيل - الكفيل

ඔහු සියලු දෑ හි ආරක්ෂකයා ය. සියලු ආත්මයන් ක්‍රියාත්මක කරන්නා ය. මැවීම් වලට පෝෂණය ලබා දීමේ භාරකාරත්වය ඔහු සතු ය. ඔවුන්ගේ සුබ සාධනය පිළිබඳ නිරීක්ෂාවෙන් සිටින්නා ය. දෙන්නා ය.

## අල් මුබීන්
## පැහැදිලි කරන්නා

المُبِينُ

තම ඒකීයභාවය, ප්‍රඥාව සහ දයාව පිළිබඳ තමා විසින් ම සාක්ෂි දරන්නා ඔහුය. දාසයින්ට අනුගමනය කිරීමට හැකි වන පරිදි තම මඟ පෙන්වීමේ මාවත පැහැදිලි කර දෙන්නා ද දුරස් ව සිටීමට හැකි වන පරිදි නොමඟ යෑමේ මාවත පැහැදිලි කර දෙන්නා ද ඔහුය.

# අල් මතීන්
# ශක්තිවන්ත ය

المتين

ඔහුගේ ශක්තිය බිඳ දමන කිසිදු ශක්තියක් නොමැත. ඔහු දැඩි ශක්තිවන්ත ය. අසාමාන්‍ය ශක්තිය ඇත්තා ය. එම ශක්තිය ට අවසානයක් නොමැත.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

مركز أصول

# අල් මුහීත්
# සර්ව ප්‍රකාර ව දන්නා ය

## الْمُحِيطُ

ඔහු සියලු දෑ සිව් දෙසින් දන්නා ය. ඔහුගේ සියලුම මැවීම් පිළිබඳ ව ඔහුගේ බලය සිව් දෙසින් විහිදී ඇත. ඉන් මිදීමට හෝ පලා යෑමට හෝ ඔවුන් කිසිවෙකු ට නොහැක. දැනුමෙන් ඔහු සියල්ල වෙළා ඇත්තේය. සියලු දෑ ගණන් කර සටහන් කර ඇත්තේය.

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM


مركز أصول
අල් ජමීල්
අලංකාර ය
الجميل
තමා තුළ සහ තම නම්, ගුණාංග සහ
ක්‍රියාවන්හි නිරපේක්ෂ සුන්දරත්වයක් ඇති
තැනැත්තා ඔහුය. මැවීම් තුළ අලංකාරය
පවතින්නේ ඔහුගේ අලංකාරය හේතුවෙනි.
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

مركز أصول

# අල් වාරිස්
# උරුමක්කරු ය

الوارث

සියලු මැවීම් විනාශ වී ගිය පසු ව ඉතිරි ව පවතින්නේ ඔහු පමණ ය. සියලු දෑ හී නැවත යොමු වීමේ ස්ථානය හා ලැගුම් ගන්නා ස්ථානය ඇත්තේ ද ඔහු වෙත ය. මරණයක් නොමැති සදා ජීවමාන ය.

ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

## අල් අලී
## අල් අඃලා - අල් මුතආල්

උසස් ය,
අති උත්තරීතර ය,
අති උදාර ය.

العلي - الأعلى - المتعال

ඔහු උත්තරීතර හා උසස් භාවයෙන් යුක්ත ය. සියලු දෑ ඔහු ගේ පාලනය ට ඔහුගේ බලය ට යටත් ය. එබැවින් ඔහු ට ඉහළින් කිසිදු බලයක් නොමැති සර්ව බලධාරී ය. ඔහු ට ඉහළින් කිසිදු උත්තරීතර භාවයක් නොමැති අති උත්තරීතර ය. ඔහු ට වඩා ශ්‍රේෂ්ඨ කිසිවක් නොමැති අති ශ්‍රේෂ්ඨ ය.

مركز أصول
ALLAH KNOWING knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

مركز أصول

# අල් වලී
## ආරක්ෂකයා

الولي

ඔහු තම මැවීමේ හා ආධිපත්‍යයේ කටයුතු කළමනාකරණය කරන තැනැත්තා වන අතර ඔහු ඔහුගේ දැහැමි දාසයින්ගේ ආධාරකරුවෙකි.

ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

## අස් සය්යිද්
## නායකයා

# السَّيِّدُ

මැවිල්ල පිළිබඳ මහා ප්‍රවීණත්වයක් ඇති තැනැත්තා ඔහුය. ඔහු ඔවුන්ගේ හිමිකරු හා ස්වාමියා ය. ඔවුන් ඔහුගේ මැවිලි හා දාසයෝය.

# අල් කවිය්යු

## බලවතා ය

القوي

පූර්ණ බලය ඇත්තා ය. කිසිවක් ඔහුව අබිබවා නොයන්නේ ය.  කිසිදු ප්‍රචණ්ඩ වාදියෙකුට ඔහු ව පරාජය කළ නොහැක. සියලු බලයන් බල පවත්වන බලවතා ය.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් හලීම්

## සෙනෙහිවන්තය

الحليم

තම ගැත්තන් කරන පාපයන් සඳහා ඔවුන් ව එකවර දඬුවම ට භාජනය නොකරන්නේ ය. නමුත් ඔවුන් පාපක්ෂමාවෙ හි නිරත වන තෙක් ඔවුන ට අවකාශ ලබා දෙන්නේ ය.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

مركز أصول

# අල් ගෆූර්
# මහත් ක්ෂමාදායීය

الغفور

ඔහු තම දාසයන්ගේ පාපයන් ප්‍රසිද්ධ නොකරයි. ඔහු අභිමත කළේ නම් ඒ වෙනුවෙන් දඬුවම් ද නොකරයි. ඔහු මහා කරුණාන්විතයාණන් ය.

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් ගෆ්ෆාර්
## අති ක්ෂමාශීලී ය

الغفار

ඔහුගෙන් ගැත්තෙකු සමාව අයැදින සෑම විටම ඔහුට සමාව ලබා දෙන්නා යන අර්ථය මෙයින් අදහස් වේ.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

## අස් සමද්
## ස්වාධීන ය

# الصمد

ඔහු පරිපූර්ණ තේජසින් යුත් අයෙකු වේ.
සියළුම ජීවීන් ඔවුන්ගේ සියලු අවශ්‍යතා
සපුරාලීම සඳහා යොමු වන්නේ ඔහු වෙත ය.
ඔහු සියල්ලන්ටම පෝෂණය සපයයි.

مركز أصول

## අල් ලතීෆ්
## ඉතා සියුම් ය

# اللطيف

මෙයින්, සියුම් කාරණා පිළිබඳ වූ අල්ලාහ්ගේ දැනුම  තවද අපේක්ෂා නොකරන සැඟවුණු මාර්ගවලින් යහපත් හා ප්‍රතිලාභ ගෙනෙන බවත්  ඔහු මෙලොවෙහි මැවිල්ලෙන් සැඟවී සිටින බවත් අදහස් කරයි. අල්ලාහ් ව ස්වර්ගයේ දී දැකිය හැක.

අල් විත්ර්
ඔත්තේ ය

الْوِتْرُ

හවුල්කරුවෙකු නැති තැනැත්තා ඔහුය.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

مركز أصول

# අස් සමීඃ
# සර්ව ශ්‍රාවක ය

السميع

සියලු ශබ්ද කොතරම් ඝෝෂාකාරී හෝ පහත්
වුවත් රහසිගත හෝ ප්‍රසිද්ධ වුවත් ඒ සෑම
දෙයක් වෙතම ඔහු සවන් දෙන්නේ ය.
තවද ඔහුගෙන් කන්නලව් කරන අයට ඔහු ප්‍රතිචාර
දක්වන්නේය.

ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

අස් සිත්තීර්
සඟවන්නා

# السِّتِّيرُ

ඔහු ලැජ්ජා භිය ඇත්තවුන් ව ප්‍රිය කරන්නේය.
තම ගැත්තන්ගේ පාපයන් සඟවන්නේ ය.
ඔවුන්ගේ අඩුපාඩු හා පාපයන් සඟවන්නේ ය.

مركز أصول
ALLAH KNOWING knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

## අල් අෆ්වු

## සමාදායක ය

العفو

ඔහු මිනිසුන්ගේ පව් මකා දමා ඒවාට සමාව දෙන අතර වැරදිකරු දඬුවමට සුදුසු වුවත් ඔහුට  දඬුවම් නොකරයි.

අල් බසීර්

සර්ව දෘෂ්ටිය ඇත්තා

البصير

ලොවෙහි පවතින සැඟවුණු හෝ ප්‍රකාශිත, කුඩා හෝ විශාල, පෙනෙන හා නොපෙනෙන සියල්ල දකින තැනැත්තා ඔහුය.

مركز أصول

# අල් හකම්
# තීරකය

الحكم

ඔහු පාලනය හා පාලකයන් ව තීරණය කරන්නා ය. සියලු නීතියන් ඔහු ට යටහත් ය. එබැවින් එයට වෙන කිසිවෙකු සුදුසු නොවන්නේ ය. ඔහු කිසිවෙකුට අපරාධයක් අසාධාරණයක් නොකරන්නේ ය.

# අත් තව්වාබ්

## පශ්චාත්තාපය පිළිගන්නා

التواب

පව් සමාව අයැදින අයව ඔහු පිළිගන්නේය. ඔහු වෙත යොමු වන්නන්ගේ පාපයන්ට සමාව දෙන්නේය. පශ්චාත්තාප වීමට ඉඩ සලසා දී එය ගැත්තන්ගෙන් පිළිගන්නේය.

# අල් කරීබ්

## සමීපතයා

القَرِيبُ

ඔහුගේ සියලු මැවීම්වලට සමීප තැනැත්තා ඔහුය. ඔහු ඔවුන්ව ආවරණය කරන අතර ඔවුන්ගේ තත්ත්වයන් පිළිබඳ මැනවින් දන්නාය. ඔහු දේවවිශ්වාසවන්තයින්ට සමීපව සිටින්නේ ඔවුන්ට සහයෝගය දැක්වීම සහ ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ ආයාචනා වලට පිළිතුරු දීමෙනි.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

مركز أصول

# අල් බාතින්
## අභ්‍යන්තර ය

الباطن

එයින් අදහස් වන්නේ ඔහු අන් සියල්ලටම වඩා සියුම් තැනැත්තා බවත් ඔහු හැර යම් දෙයකට වඩා සමීප අයෙකු නැති බවත් ය. තවද ඔහු සියලු රහස් සහ සැඟවුණු දේවල් දනී.

ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

# අල්හමීද්

## ප්‍රශංසාලාභී ය

الحميد

සියලු පැසසුම් වලට සුදුස්සා ඔහු ය. ඔහුගේ නාමයන් ඔහුගේ ගුණාංගයන් ඔහුගේ ක්‍රියාවන් හා ඔහුගේ ප්‍රකාශයන් සියල්ල මත ඔහු ප්‍රශංසාලාභී ය. එමෙන් ම ඔහුගේ උපකාරයන් ඔහුගේ දහම් ගත කිරීම් හි ද ප්‍රශංසාලාභීය. තම ගැත්තන් සිදු කරන කුඩා යහපතක ට වුව ද කෘතවේදී වන ප්‍රශංසාලාභයී.


مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

# අල් හයියි

## නිහතමානී- ලැජ්ජාසහගත

الحَيِيُّ

තම මහිමාන්විතභාවයට හා අතිමහත් බලයට ගැළපෙන නිහතමානීකම උසුලන්නා ඔහුය. සැබවින්ම  සර්වබලධාරී අල්ලාහ්ගේ නිහතමානිකම වනාහි ඔහුගේ ත්‍යාගශීලිත්වය, කරුණාව සහ ශ්‍රේෂ්ඨත්වයයි.


ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් හය්යු - අල් කය්යූම්

## සදා ජීවමානය

# الحيّ - القيّوم

සදා ජීවමානය යනු ආරම්භයක් හෝ අවසානයක් නැති ස්ථිර ජීවිතයක් හා පැවැත්මක් ඇති තැනැත්තා ය. ඔහු මරණය ට පත් නොවන්නා ය. සදා අමරණීය ය. මරණය හෝ විනාශය හෝ කිසිවිටක ඔහු ට අත් නොවන්නේ ය.

## අල් අලීම් - අල් ආලිම්

**සර්ව ඥානීය**

**ඥානීය**

العليم - العالم

කිසිවක් ඔහුගෙන් සැඟවෙන්නේ නැත. රහසය හා සැඟ වී ඇති සියල්ල පිළිබඳවත් බාහිර ව හා අභ්‍යන්තරයේ ඇති සියල්ල පිළිබඳවත් ප්‍රකාශයන් හා ක්‍රියාවන් පිළිබඳවත් දෘෂ්‍යමාන හා අදෘෂ්‍යමාන සියලු දෑ පිළිබඳවත් මනා ඥානයක් ඇත්තා ය. සියලු ගුප්ත දෑ පිළිබඳ ව මහා ඥානී ය. සියලු දෑ පිළිබඳ ව සර්වඥ ය.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් අහද්:
### ඒකීය භාවයෙන් යුක්ත

# الأحد

ඔහු සර්ව සම්පූර්ණ භාවයන් සපිරුණු ඒකීය ය. ඔහු ට කිසිදු හවුල්කරුවෙකු නොමැත.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

ALLAH KNOWING knowingallah.com

GUIDE TO ISLAM

# අල් මජීද්

## කීර්තිය

المجيد

ඔහු තම ක්‍රියාවන් තුළින් කීර්තිය ට බඳුන් වන්නා ය.
ඔහුගේ මැවීම් ඔහු පිළිබඳ ඇති ගෞරවය හේතුවෙන්
ඔහු ව කීර්තිය ට පත් කරන්නේ ය.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

## අල් මුජීබ්
## ප්‍රත්‍යුත්තර දෙන්නා

المجيب

ඔහුගේ දැනුම හා ප්‍රඥාව අනුව තම දාසයන්ගේ කැඳවීමට හා ආයාචනා කිරීමට පිළිතුරු දෙන්නේ ඔහුය.

## අෂ් ෂාකිර්
## අෂ් ෂකූර්
### කෘතඥභාවයෙන් යුක්ත
### කෘතවේදී

الشَّاكِرُ الشَّكُورُ

ඔහු ට සුළු දැයකින් අවනත වුව ද ඔහු එයට කෘතවේදී වන්නා ය. ඒ වෙනුව ට අති මහත් කුසල් පිරිනමන්නේ ය. අධික සම්පත් පිරිනමන්නේ ය. කෘතවේදී වන පරිදි කුඩා දෙයක් කළ ද එය ඔහු පිළිගන්නේ ය. ඔහු තිළිණ ප්‍රගුණ කරන්නේ ය. පාපයන් මකා දමන්නේ ය. නිලයන් උසස් කරන්නේ ය.

مركز أصول

ALLAH KNOWING knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM

مركز أصول

# අල් ෆත්තාහ්
# විවර කරන්නා

## الفتاح

ඔහු තම ගැත්තන් අතර සත්‍යය හා යුක්තිය ගෙන තීන්දු කරන්නා ය. ඔහු තම විශ්වාසනීය ගැත්තන් හට තම කරුණා ව පෝෂණය හා උපකාරයේ දොරටු විවෘත කරන්නේ ය. ගුප්ත දෑ හි යතුරු පිළිබඳ දැනුම ඇත්තා ඔහු පමණ ය.

# අල් - කය්යූම්
## සදා පැවැත්ම ඇත්තා

# القيوم

ඔහු ස්ව පැවැත්මෙන් යුක්ත ය. කිසිවෙකුගේ අවශ්‍යතාවක් නොමැත. කිසිවෙකු මත යැපෙන්නේ ද නැත. සියලු මැවීම් සැලසුම් කිරීමෙ හි ස්වයංව ක්‍රියා කරන්නා ය. ජීවමාන ය. සදා පැවැත්මක් ඇත්තා ය. ඔහු ට විඩාවක් හෝ නින්දක් හෝ ඇති නොවන්නේ ය.

## අල්වාහිද්
## කේවලය

الواحد

ඔහුගේ නිරපේක්ෂ පරිපූර්ණත්වයේ තනි හා අද්විතීය තැනැත්තා ඔහුය. කිසිවෙකු ඒවා ඔහු සමඟ බෙදා නොගනී. කිසිවෙකු ඔහුට සමාන නොවේ.

مركز أصول
ALLAH KNOWING
knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

مركز أصول

# අල් වාසිඃ
# සර්ව ව්‍යාපකය

الواسع

සියලු දෑ වෙත ඔහුගේ කරුණා ව ව්‍යාප්ත ව ඇත. සියලු දෑ පිළිබඳ ඔහුගේ ඥානය ද ව්‍යාප්ත ව ඇත. සියලු මැවීම් වලට ඔහුගේ පෝෂණය ද ව්‍යාප්ත ව ඇත . විභූතිය පාලනය හා බලය ද ව්‍යාප්ත ව ඇත. භාග්‍යය හා උපකාරය ද ව්‍යාප්ත ව ඇත.

ALLAH KNOWING knowingallah.com
guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
GUIDE TO ISLAM

## අල් (ක)හබීර්
## අභිඥානවන්තය

الخَبِيرُ

ඔහුගේ මැවීම් හි කිසිදු කරුණක් ඔහු ට සැඟවෙන්නේ නැත. එය යම් චලනයක් හෝ ස්ථාවර පැවැත්මක් වුව ද යම් බාහිර හෝ අභ්‍යන්තර දෙයක් වුව ද ඔහු ට සැඟවෙන්නේ නැත.

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11
ALLAH KNOWING knowingallah.com
GUIDE TO ISLAM
مركز أصول

مركز أصول

# අල් මවුලා
## භාරකරු

المولى

ඔහු රජු සහ දැහැමි ගැත්තන්ට  සහයෝගය දක්වන, උපකාර කරන සහ ආරක්ෂා කරන ස්වාමියාය.

ALLAH KNOWING
knowingallah.com



GUIDE TO ISLAM

مركز أصول

# අල් - හාෆිල්:
## ආරක්ෂකයා
# අල් - හෆීල්:
## සුරක්ෂකයා

# الحافظ - الحفيظ

ඔහු ඔහුගේ මැවීම් සියල්ල ආරක්ෂා කරන්නේ ය. ඒවා පිළිබඳ ව ඔහුගේ ඥානය විහිදී පවතින්නේ ය. තම ගැත්තන්ගේ ක්‍රියාවන් ඔහු සුරක්ෂිත ව සටහන් කරන්නේ ය. ඔහුගේ දැහැමියන් පවෙ හි වැටීමෙන් සුරක්ෂා කරන්නේ ය. ඔහු සුරක්ෂා කරන කිසිවක කිසිදු අඩුපාඩුවක් ඇති නොවන්නේ ය.



ALLAH KNOWING
knowingallah.com
GUIDE TO ISLAM

අෂ් ෂහීද්
සම්මුඛ

الشَّهِيدُ

සියලු දෑ අබියස සම්මුඛ ව සිටින්නා ය. සියලු දෑ සර්ව ප්‍රකාරයෙන් දන්නා ය. තව ද ඔහු තම ගැත්තන් වෙනුවෙන් ඍජු ව පෙනී සිටින්නා ය. එමෙන් ම තම ගැත්තන් තමන් වෙනුවෙන් ඉටු කරන දෑ පිළිබඳ ව සාක්ෂි දරන්නා ය.

مركز أصول

ALLAH KNOWING
knowingallah.com

guidetoislam.org guidetoislam1 guidetoislam www.guidetoislam.com11

GUIDE TO ISLAM